A

# නිවේදනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ අභියෝගයට ලක්කරන ලද **"පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන)"** නැමැති පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි.

පනත් කෙටුම්පතෙහි 4 වැනි වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව සමඟ අනනුකූල වන බැවින් අධිකරණය විසින් යෝජනා කර ඇති පරිදි එම වගන්තිය සංශෝධන කිරීමෙන් අනනුකූලතාවය ඉවත් කළ හැකි බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

තවදුරටත්, පනත් කෙටුම්පතෙහි අනෙකුත් විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමඟ අනනුකූල නොවන බවද එහි සිංහල හා ඉංග්‍රීසි පිටපත්වල 2 වැනි වගන්තියේ ඇති වී තිබෙන අනනුකූලතාවය කාරක සභා අවස්ථාවේදී නිවැරදි කළ හැකි බවද ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යයි මම නියෝග කරමි.